## ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට රබර් පර්යේෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රබර් තොගය හැර රු.10,932,081 ක් වූ අනෙකුත් බඩු තොග වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ අගය මත නොව, පොත් අගය මත ගිණුම්වලට ගෙන තිබුණි. එබැවින් හානි වීම්, නැතිවීම් ආදියෙන් වන පාඩු මූල්‍ය ප්‍රකාශනවලින් අනාවරණය නොවන බව නිරීක්ෂණය විය.

(ආ) කුරුවිට වතුයායේ 2012 වර්ෂයේ රබර් කිරි විකුණුම් වටිනාකම රු.36,622,548 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණේ විකුණුම් වලින් මුදලින් ලද රු.34,456,466 ක් පමණි. ඒ අනුව විකුණුම් සහ ණය ගැතියන් රු.2,166,082 ක් අඩුවෙන් දැක්වුණි.

(ඇ) ඩාර්ටන්ෆීල්ඩ් සහ කුරුවිට වතුවලට අදාළ එකතුව රු.1,280,021 ක්වූ වත්කම් ක්ෂය වීම් වාහන විකිණීමෙන් ලද රු.778,178 ක්ද මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගලපා නොතිබුණි.

#### 1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.28,196,205 ක්වූ ණයගැති ශේෂයන් වර්ෂ 5 කට අධික කාලයක සිට පැවත එන ණය ගැතියන් 405 කට අදාල රු.16,326,874 ක ණයගැති ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය විසින් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 1985 වර්ෂයේදී උපදේශක සේවා දෙපාර්තමේන්තුවට ලබා දී තිබූ රු.5,214,500 ක් වූ අත්තිකාරම් අයකර ගැනීමට හෝ ලියා හැරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර තිබුණු ශ ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය දරන සේවකයන් වෙනුවෙන් අයවිය යුතු රු.1,798,731ක්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් අයකර ගැනීමට 2013 ජූලි 15 දින වනවිටත් කටයුතු කර නොතිබුණි.

(ඈ) උපාධිධාරීන් පුහුණු කිරීම් වෙනුවෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් අයවිය යුතු රු.627,984 ක් දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබූ අතර, නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) අයකර ගැනීම සඳහා නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අවුරුදු 15 කට වඩා පැරණි රු.4,746,939 ක් වටිනා ඇප සුරැකුම් ණයගැති ශේෂයන් අයකර ගැනීමට හෝ ලියාහැරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඊ) වාරික ගෙවීම මඟ හැර තිබූ ඇප සුරැකුම් ණය ගැතියන් තිදෙනෙකුගෙන් ලැබිය යුතු රු.2,989,277 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) මූල්‍ය ප්‍රකාශනවල 3(ii)(c) සටහනේ දක්වා තිබුණු රු.11,112,317 ක් වටිනා ණයගැති ශේෂයෙන් රු.2,228,588 ක ණයගැති ශේෂ 21 ක් වසර 06 කට අධික කාලයක සිට පැවත එන ශේෂ අයවන බවට තහවුරුවීම් ඉදිරිපත් නොවුණි.

(ඌ) සටහන අංක 08-A-i යටතේ ගෙවිය යුතු අත්තිකාරම් රු.9,258,909 ක් තුළ අන්තර්ගත වූ රු.1,976,077 ක් වටිනා ශේෂයන් 19 ක් හා ඩාර්ටන්ෆීල්ඩ් වතුයායේ රු.9,760,698 ක් වූ ණය හිමි ශේෂය තුළ අන්තර්ගත රු.341,373 ක් වටිනා ශේෂයන් 2 ක් පියවීමට හෝ පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(එ) ශේෂ පත්‍ර සටහන් අංක 3.i යටතේ දක්වා ඇති රු.443,447 ක් වටිනා අයවිය යුතු ශේෂයන් අතරින් ආයතන 6 කින් අයවිය යුතු රු.101,306 ක් වටිනා තැන්පතු ශේෂයන් වසර 7 කට වඩා පැරණි ශේෂයන් වූ අතර ඒවා අයවන බවට කිසිදු තහවුරුවක් විගණනයට ඉදිරිපත් නොවුණි.

**1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොවීය.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ස්ථාවර වත්කම් | 398,626,685 | ස්ථාවර වත්කම් ලේඛනය |
| (ආ) | සාමාන්‍ය ණය ගැතියෝ | 19,990,736 | ණය ගැති ශේෂ සනාථ කිරීම් |
| (ඇ) | ඩාර්ටන් ෆීල්ඩ් වතුයායෙන් ලැබිය යුතු ශේෂ | 8,502,490 | ණය ගැති ශේෂ සනාථ කිරීම් |
| (ඈ) | අත්තිකාරම් ලැබීම් | 9,258,909 | ණයහිමි කාල විශ්ලේෂණය |

**1.2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

මණ්ඩලයේ වාහනයක් වැවිලි කර්මාන්ත අමාත්‍ය කාර්ය මණ්ඩලයේ රාජකාරී සඳහා මුදාහැර තිබූ අතර, මාසයකුත් දින 04 ක් තුළ කි.මී 4091 ධාවනයේ යොදා තිබුණද, මුදල් රෙගුලාසි 1645 ප්‍රකාරව දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය භාණ්ඩාගාරයෙන් ලද රු.185,705,000 ක ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු රු.68,557,639 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද රු.183,100,000 ක ප්‍රදාන ගණන් ගැනීමෙන් පසු රු.18,547,965 ක අතිරික්තයක් විය. පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.87,105,604 ක පිරිහීමක් පෙන්නුම් කළ අතර, එය ප්‍රතිශතයක් ලෙස සියයට 475 ක් විය. ඒ සඳහා පසුගිය වර්ෂයට සාපේක්ෂව මණ්ඩලයේ ආයතන සහ පරිපාලන වියදම් සියයට 20 කින් වැඩිවීමත්, ඩාර්ටන් ෆීල්ඩ් සහ කුරුවිට වතුවල ලාභය පසුගිය වර්ෂයට සාපේක්ෂව පිළිවෙළින්

සියයට 36 සහ සියයට 44 කින් අඩුවීමත්, කුමාරවත්ත වතුයායේ අලාභය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 42 කින් වැඩිවීමත් බලපා තිබුණි.



## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාරයෙන් ලද ප්‍රදාන සමඟ මණ්ඩලයේ මුළු ආදායම රු.197,880,882 ක්වූ අතර, එය ඉකත් වර්ෂයේ රු.196,888,110 ක මුළු ආදායම සමඟ සැසඳීමේදී සියයට 0.5 ක වර්ධනයක් විය.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රබර් පර්යේෂණ මණ්ඩලයේ මුළු වියදම රු.312,621,408 ක්වූ අතර, එය ඉකුත් වර්ෂයේ මුළු වියදම වූ රු.259,821,971 සමඟ සැසඳීමේදී සියයට 20 ක වැඩිවීමක් විය.

(ඇ) ඩාර්ටන් ෆීල්ඩ්, කුරුවිට, කුමාරවත්ත සහ නාරම්පොල යන වතු හතරෙන් උපයන ලද සමස්ථ ලාභය සමාලෝචිත වර්ෂයේදී රු.46,182,886 ක්වූ අතර, ඉකුත් වර්ෂයේ එය රු.81,481,826 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ ලාභයේ අඩුවීම සියයට 43 ක් විය. රබර් කිලෝවක් සඳහා ලැබුණු දළ විකුණුම් සාමාන්‍ය මිල පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 17 කින් පහත වැටීමත්, 2012 වර්ෂයේ පැවති අයහපත් කාලගුණික තත්ත්වය සහ සේවක පක්ෂයේ ඇති වූ සෞඛ්‍ය ගැටළුත් මෙම ලාභය අඩුවීම කෙරෙහි ප්‍රධාන ලෙස බලපා තිබුණි.

## 2.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුද්ගලයින් තිදෙනෙක් විසින්, සේවය නතර කිරීම සම්බන්ධයෙන් වන්දි ඉල්ලා ආයතනයට එරෙහිව අධිකරණවල නඩු 05 ක් ගොනු කර තිබූ අතර, ගෙවිය යුතු වන්දිය පිළිබඳ එකඟතාවයකට එළඹ නොතිබුණි.

(ආ) ආයතනය විසින් ආයතනය සතු ලොරි රථය බොඩි ගැසීමට රැගෙන ගොස් නැවත ලබානොදීම සම්බන්ධයෙන් අදාල පුද්ගලයාට එරෙහිව රු.730,000 ක වන්දි ඉල්ලා මතුගම දිසා අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

(අ) රබර් කිරි නිෂ්පාදයේ කාර්යසාධනය

කුරුවිට වතුයායේ සහ ඩාර්ටන් ෆල්ඩ් වතුයායේ රබර් කිරි නිෂ්පාදනයට අදාළ තොරතුරු පහත දැක්වේ.

| | 2012 වර්ෂය | | | | 2011 වර්ෂය | | | | වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| කිරි කපන වතුයාය | රබර් වගා ඉඩම් ප්‍රමාණය | හෙක්ටයාරයක නිෂ්පාදනය | වර්ෂයේ මුළු නිෂ්පාදන ප්‍රමාණය | නිෂ්පාදනයේ වටිනාකම | රබර් වගා ඉඩම් ප්‍රමාණය | හෙක්ටයාරයක නිෂ්පාදනය | වර්ෂයේ මුළු නිෂ්පාදන ප්‍රමාණය | නිෂ්පාදනයේ වටිනාකම | ප්‍රමාණය (අඩුවීම)/වැඩිවීම | වටිනාකම (අඩුවීම)/වැඩිවීම |
| | හෙක්ටයාර | කි.ග්‍රෑ | කි.ග්‍රෑ | රු. | හෙක්ටයාර | කි.ග්‍රෑ | කි.ග්‍රෑ | රු. | කි.ග්‍රෑ | රු. |
| ඩාටන් ෆල්ඩ් | 174.85 | 1096 | 191590 | 73,448,195 | 181.61 | 1016 | 184596 | 94,080,018 | 6994 | (20,631,823) |
| කුරුවිට වතුයාය | 71.29 | 1403.32 | 100,043 | 36,622,548 | 68.79 | 1495 | 102825 | 45,534,926 | (2782) | (8,912,378) |

ඉහත තොරතුරු සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කුරුවිට වතුයාය හා සසඳන විට ඩාර්ටන්ෆීල්ඩ් වතුයායේ හෙකටයාරයකට රබර් කිරි නිෂ්පාදනය 2011 වර්ෂයේදී කිලෝ ග්‍රෑම් 479 කින්ද 2012 වර්ෂයේදී කිලෝ ග්‍රෑම් 307 කින් ද පහත බැස තිබුණි. කුරුවිට වත්තේ වගාවන් පර්යේෂණ වගාවන් වීම, වැසි ආවරණ භාවිතය, දේශගුණික තත්ත්වය , භූමියේ පිහිටීම, කුරුවිට භූමි ප්‍රමාණය අඩු බැවින් නඩත්තු කටයුතු කරගෙන යාමේ පහසුව සහ වගාවේ වයස යන හේතූන් කුරුවිට වතුයායේ හෙක්ටයාර් ඒකක රබර් කිරි නිෂ්පාදනය ඩාර්ටන්ෆීල්ඩ් වතුයායට සාපේක්ෂව වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ii) ඩාර්ටන්ෆීල්ඩ් වතුයායේ 2011 වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ රබර් කිරි නිෂ්පාදනය හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 80 කින් වැඩි වී තිබුණි.

(iii) කුරුවිට වතුයායේ 2011 වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයෙ රබර් කිරි නිෂ්පාදනය හෙක්ටයාරයකට කිලෝ ග්‍රෑම් 92 කින් පහත බැස තිබුණි. සේවක පක්ෂයේ ඇතිවූ සෞඛ්‍ය ගැටළු සහ අයහපත් කාලගුණික තත්ත්වය මේ සඳහා හේතු වී ඇති බව මණ්ඩලයේ අදහස වී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද දැනට වසර 10 කට පෙර ආරම්භ කර තිබූ ව්‍යාපෘති 84 අතරින් ව්‍යාපෘති 12 ක් ඉටු කිරීමේ ප්‍රගතිය සියයට 25 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රබර් පර්යේෂණ මණ්ඩලයේ පරිපාලන නිලධාරී තනතුරට බඳවාගත් නිලධාරියා විසින් ඉදිරිපත් කරන ලද සේවා සහතිකය අනුව 2005-2009 කාල සීමාව තුළ පෞද්ගලික සමාගමක අදාල තනතුරෙහි වසර 3½ ක සේවා පළපුරුද්දක් ඇති බව සඳහන් කර තිබුණද, එම ආයතනයෙහි මාස 06 ක පුහුණුවක් පමණක් ලබාගෙන තිබුණු අතර අදාල කාල සීමාව තුළ වෙනත් පෞද්ගලික සමාගම් දෙකක සේවය කර ඇති බව සේවක අර්ථසාධක අරමුදල් වාර්තා මගින් තහවුරු වූයෙන් ඉදිරිපත් කර ඇති සේවා සහතිකය ව්‍යාජ එකක් බව සනාථ විය.

(ආ) අගලවත්ත රබර් පර්යේෂණ ආයතනයේ ඩාර්ටන්ෆීල්ඩ් කාර්යාලයේ ශ්‍රවණාගාරයක් ඉදිකිරීම සඳහා 2011 සැප්තැම්බර් 28 දින කොන්ත්‍රාත් සමාගමක් සමඟ රු.288,838,759 ක ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම අනුව මෙම ශ්‍රවණාගාරය දින 270 ක් ඇතුළත නිමකළ යුතු වුවත් 2013 අගෝස්තු වන විටත් මෙම කොන්ත්‍රාත්තුව නිමකර නොතිබූ අතර, ප්‍රමාද ගාස්තු අයකිරීම සම්බන්ධව ගිවිසුමේ කොන්දේසි ඇතුළත් කර නොතිබුණි. එසේම භූමියේ යෝග්‍යතාවය පරීක්ෂා කිරීමකින් තොරව ඉදිකිරීම් කටයුතු සිදුකිරීම නිසා ගොඩනැගිල්ලේ ආරක්ෂාව සඳහා පැති බැම්මක් ඉදිකිරීම වෙනුවෙන් රු.2,007,487 ක අතිරේක මුදලක් වැය කිරීමට සිදුව තිබුණි. ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු එක් වගකිව යුතු නිලධාරියෙකුගේ නිරන්තර අධීක්ෂණයට භාජනය වී නොතිබූ අතර, එම හේතුව නිසා බිත්ති ඉරිතැලීම්, සිවිලිම සම්පූර්ණ නොකිරීම හා බිම් මහලේ බිත්ති තෙතමනයෙන් යුක්ත වීම ආදී අඩුපාඩු නිරීක්ෂණය විය.

3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිවිසුමකට එළඹීමකින් තොරව මාස 06 ක් මුළුල්ලේ පුද්ගලික රබර් සමාගමකට වටිනාකම රු.17,341,672 ක් වූ රබර් කිරි විකුණා තිබුණි.

(ආ) කිසිදු මිල ගණන් කැඳවීමකින් තොරව රු.564,480 ක් ගෙවා පෞද්ගලික සමාගමකින් වැසි ආවරණ ගම් කි.ග්‍රෑම් 3360 ක් මිලට ගෙන තිබූ අතර මෙම වැසි ආවරණ ගම්, වෙනත් පෞද්ගලික සමාගමකින් මිලට ගත්තේ නම් රු.352,800 කට මිලට ගැනීමට හැකිව තිබූ බව විගණනයේදී නිරීක්ෂණය වූ අතර එයින් රු.211,680 ක මුදලක් ඉතිරි කරගත හැකිව තිබුණි.

(ඇ) කම්කරුවන්ට වැටුප් ගෙවීමේදී ඔවුන්ගේ අනන්‍යතාවය පරීක්ෂා කිරීමෙන් තොරව වැටුප් ගෙවා තිබූ අතර, සමහර කම්කරුවන්ගේ වැටුප ඔහුගේ ලිඛිත අවසරයකින් තොරව වෙනත් පුද්ගලයන්ට ගෙවා තිබුණි. සමහර කම්කරුවන් තමන්ගේ කාර්ය නිසි පරිදි ඉටුකළ බවට අධීක්ෂණ නිලධාරීන්ගෙන් සනාථ කර ගැනීමකින් තොරව වැටුප් ගෙවා තිබුණි. මෙම කරුණු නිසා ව්‍යාජ නම් ඇතුළත් කර වංචාවක් සිදුවීමට ඇති ඉඩකඩ වැඩි බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) අතිරේක අධ්‍යක්ෂ තනතුරට බඳවාගෙන සිටින නිලධාරියා මෙහෙයවන ලද "රබර් බනානා ඉන්ටක්‍රොප්ස් වැඩසටහන" 1998 වර්ෂයේ සිට ක්‍රියාත්මකව 2001 වර්ෂයේ අවසන් කිරීමට නියමිතව තිබුණද, එම අරමුදලින් මාසිකව රු.14,000 බැගින් 2002 වර්ෂය තුළ ද රු.168,000 ක මුදලක් වැටුපට එකතුකර ලබාගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය 2003 වසරේදී අවසන්ව ඇති බව ආයතනයෙන් දන්වා තිබුණද, එය තහවුරු කර ගැනීම සඳහා ව්‍යාපෘතිය අවසන් කිරීමේ වාර්තාව පරීක්ෂා කිරීමට අදාළ ලිපිගොනුව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රබර් පර්යේෂණ මණ්ඩලයේ සභාපතිවරයා වෙත අනුයුක්ත කර ඇති රියදුරු දෛනික වැටුප් පදනම මත අනුයුක්ත කර ඇති අතර, ඔහු නිවාඩු ලබා තිබියදී එම දින සඳහා වැටුප් හා අතිකාල ලෙස රු.29,949 ක් ගෙවා තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
------------------------------------------

4.1 සංයක්ත සැලැසම හා ක්‍රියාකාර් සැලැස්ම
----------------------------------------------

2013-2017 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. ඉදිරි වර්ෂවලට අදාළ පුරෝකථනයන් සමඟ සැසඳීමට හැකි පරිදි පසුගිය වර්ෂවලට අදාළ මූල්‍ය තොරතුරු සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගත නොවූ අතර, වර්ෂ 05 ක කාලය තුළ ළඟා කර ගැනීමට අපේක්ෂිත භෞතික ඉලක්කයන්ට අදාළ මූල්‍ය වටිනාකම් වෙන් වශයෙන් ඉදිරිපත් කර නොතිබුණි.

4.2 අයවැය ලේඛනමය පාලනය
------------------------------------

සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 05 ක් සඳහා ඇස්තමේන්තුගත වියදම සියයට 5 සිට සියයට 75 ක පරාසයක ප්‍රමාණයකින් ඉක්මවා උපයෝජනයන් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධන වියදම් සඳහා රු.මිලියන 57.4 ක් ඇස්තමේන්තුගත කර තිබුණත්, තථ්‍ය වියදම රු.මිලියන 27.31 ක්වී තිබුණි. ඒ අනුව මූලධන වියදම ඇස්තමේන්තුගත වියදමෙන් සියයට 52ක් උපයෝජනය කිරීමට අපොහොසත් වී තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලනයන්
------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(අ) අයවැය පාලනය

(ආ) ස්ථාවර වත්කම් පාලනය

(ඇ) තොග පාලනය

(ඈ) ගිණුම්කරණය

(ඉ) පර්යේෂණ කටයුතු පරිපාලනය

(ඊ) මිලදී ගැනීම්